ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2001 අංක 9 දරන මුහුදු කොල්ලකෑම් පනත

---

**[සහතිකය සටහන් කළේ 2001 අගෝස්තු මස 09 වන දින.]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2001 අගෝස්තු මස 10 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 12.25 යි.     තැපැල් ගාස්තුව : රු. 5.25 යි.

# 2001 අංක 9 දරන මුහුදු කොල්ලකෑම් පනත

[සහතිකය සටහන් කළේ 2001 අගෝස්තු මස 09 වන දින]

එල්. ඩී.– ඕ. 11/97.

**ශ්‍රී ලංකාව තුළ මුහුදු කොල්ලකෑම් මැඩපැවැත්වීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2001 අංක 9 දරන මුහුදු කොල්ලකෑම් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස
## පරිපාලනය

2. (1) ශ්‍රී ලංකාව තුළ මුහුදු කොල්ලකෑම මැඩපැවැත්වීම සඳහා වූ සියලු පියවර සම්බන්ධීකරණය කිරීම සහ ඒ පියවර ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම සම්බන්ධයෙන්, වෙළෙඳ නැව් අධ්‍යක්ෂවරයා විමසා ශ්‍රී ලංකා වරාය අධිකාරිය වගකිව යුතු ය. මුහුදු කොල්ලකෑම මැඩපැවැත්වීම සඳහා වූ පියවර ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නියාමනය කළ යුතු බව.

(2) ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිටත මුහුදු කොල්ලකෑමට අදාළ තොරතුරු එක්රැස්කිරීම, සංචයනය කිරීම සහ පතළ කිරීම ද, මුහුදු කොල්ලකෑම මැඩපැවැත්වීම පිණිස ගනු ලැබිය යුතු පියවර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් සහාය ලබා දීම ද, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යය විය යුතු ය.

## II වන කොටස
## වැරදි

3. සොරකම් කිරීමෙන්, බලහත්කාරයෙන්, බිය ගැන්වීමෙන්, රැවටීමෙන්, වංචා කිරීමෙන් හෝ වෙනත් සමාන අන්දමකින් යම් නැවක් වංක ලෙස ගනු ලබන හෝ අයිතිකර ගනු ලබන යම් තැනැත්තකු, මුහුදු කොල්ලකෑමේ වරදට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, මේ පනතේ 8 වන, 9 වන සහ 10 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, අවුරුදු පහකට නොඅඩු වූ ද අවුරුදු දහයක් නොඉක්මවන්නා වූ ද කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු ය ; තව ද, රුපියල් එක් මිලියනයකට නොඅඩු වූ ද රුපියල් මිලියන දහයක් නොඉක්මවන්නා මුහුදු කොල්ලකෑම.

වූ ද දඩයකට හෝ වරද සිදු කරනු ලැබුවේ යම් නැවක් සම්බන්ධයෙන් ද ඒ නැවේ වටිනාකමට සමාන මුදලක් යන මේ දෙකෙන් වඩා වැඩි දඩයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

නැවෙන් දේපළ ගැනීම.

**4.** සොරකම් කිරීමෙන්, බලහත්කාරයෙන්, බියගැන්වීමෙන්, රැවටීමෙන්, වංචා කිරීමෙන් හෝ වෙනත් සමාන අන්දමකින් යම් නැවකින් යම් දේපළක් වංක ලෙස ගනු ලබන හෝ අයිතිකර ගනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, මේ පනතේ 8 වන, 9 වන සහ 10 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, අවුරුදු තුනකට නො අඩු වූ සහ අවුරුදු හතක් නොඉක්මවන්නා වූ ද කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ද, රුපියල් එක් මිලියනයකට නොඅඩු වූ සහ රුපියල් මිලියන පහක් නොඉක්මවන්නා වූ ද දඩයකට හෝ වරද සිදු කරනු ලැබුවේ යම් දේපළක් සම්බන්ධයෙන් ද, ඒ දේපළේ වටිනාකමට සමාන මුදලක් යන මේ දෙකෙන් වඩා වැඩි දඩයකට ද ඒ තැනැත්තා යටත් විය යුතු ය.

නීත්‍යානුකූල බලයක් නොමැතිව නැවකට ගොඩවීම.

**5.** කපිතාන්වරයාගේ, නෞකාධිපතිවරයන්ගේ හෝ යම් නැවක් භාර තැනැත්තකුගේ නිසි අවසරයක් හෝ නීත්‍යානුකූල බලයක් නොමැතිව, මුහුදේ දී හෝ නැව් තොටක හෝ වරායක හෝ සමුද්‍රාභිමුඛයෙහි නතර කර තිබෙන අතරතුර දී, යම් නැවකට ඇතුළුවන හෝ ගොඩවෙන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, මේ පනතේ 8 වන, 9 වන සහ 10 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, අවුරුදු දෙකක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට සහ දඩයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

මංකොල්ල කෑ නැවක් සහ දේපළක් රඳවා තබාගැනීම, සන්තකයේ තබා ගැනීම හෝ ප්‍රවාහනය කිරීම.

**6.** මේ පනතේ 3 වන වගන්තිය හෝ 4 වන වගන්තිය යටතේ වරදක් සිදු කිරීම මගින් ගනු ලැබූ හෝ අයිතිකරගනු ලැබූ යම් නැවක් හෝ දේපළක් වංක ලෙස බලයෙන් පවරා ගනු ලබන, භාරගනු ලබන, රඳවා ගනු ලබන හෝ ප්‍රවාහනය කරනු ලබන තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, මේ පනතේ 8 වන, 9 වන සහ 10 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, අවුරුදු තුනක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් එක්

මිලියනයක් නොඉක්මවන්නා වූ දඩයක් හෝ වරද සිදු කරනු ලැබුවේ යම් දේපළක් සම්බන්ධයෙන් ද, ඒ දේපළේ වටිනාකම හෝ යන මේ දෙකෙන් වඩා වැඩි දඩයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

තැත් කිරීම.

**7.** (1) මේ පනතේ 3 වන හෝ 4 වන වගන්තිය යටතේ වරදක් සිදු කිරීමට තැත් කරන හෝ ඒ වරද කිරීමට ආධාර හෝ අනුබල දෙන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, මේ පනතේ 8 වන, 9 වන සහ 10 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, අවුරුදු පහක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් මිලියන දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(2) මේ පනතේ 5 වන හෝ 6 වන වගන්තිය යටතේ වරදක් සිදු කිරීමට තැත් කරන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, මේ පනතේ 8 වන, 9 වන සහ 10 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, අවුරුදු එකක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ දඩයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

වරදක් සිදු කරන අතරතුර බලය යෙදවීම හෝ බිය ගැන්වීම.

**8.** මේ පනතේ 3 වන හෝ 4 වන හෝ 5 වන හෝ 6 වන වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු පිළිබඳ නඩු විභාගයේ දී, ඒ වරද සිදු කිරීමෙහි ලා ඒ තැනැත්තා විසින් බලය යෙදවීම හෝ බිය ගැන්වීම කර ඇති බව ඔප්පු කරනු ලැබ ඇති අවස්ථාවක, අවුරුදු දොළහක් දක්වා දීර්ඝ විය හැකි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමෙන් ඔහුට දඬුවම් කරනු ලැබිය හැකි ය.

වරදක් සිදු කිරීමේ දී ආයුධයක් භාවිත කිරීම.

**9.** මේ පනතේ 3 වන හෝ 4 වන හෝ 5 වන හෝ 6 වන වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු පිළිබඳ නඩු විභාගයේ දී, ඒ වරද සිදු කරන විට ඒ තැනැත්තා මාරක ආයුධයක් අතැතිව සිටි බව ඔප්පු කරනු ලැබ ඇති අවස්ථාවක, අවුරුදු පහළොවක් දක්වා දීර්ඝ විය හැකි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමෙන් ඔහුට දඬුවම් කරනු ලැබිය හැකි ය.

වරදක් සිදු කරන අතරතුර දී පීඩාවට පත් කිරීම.

**10.** මේ පනතේ 3 වන හෝ 4 වන හෝ 5 වන හෝ 6 වන වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු පිළිබඳ නඩු විභාගයේ දී, ඒ වරද කිරීමේ දී ඒ තැනැත්තා විසින් ස්වේච්ඡාවෙන්ම වෙනත් යම් තැනැත්තකුට තුවාල සිදු කරන ලදැයි ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා සහ වෙනත් යම් තැනැත්තකු විසින් එක්ව සම්බන්ධවීමෙන් ඒ වරද සිදු කරන ලද නම් ඒ තැනැත්තන්ට අවුරුදු විස්ස දක්වා දීර්ඝ විය හැකි කාලයක බන්ධනාගාරගත කිරීමක දණ්ඩන නියමයක් කරනු ලැබිය හැකි ය.

රාජසන්තක කිරීම.

**11.** (1) මේ පනතේ 3 වන, 4 වන හෝ 5 වන වගන්ති යටතේ වූ වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක ඒ නැව, මෝටර් වාහනය හෝ ප්‍රවාහන මාධ්‍යය හෝ දේපළ ඒ වරද සිදු කිරීමෙහි ලා හෝ ඒ සම්බන්ධයෙන් භාවිත කරන ලද්දේ තමාගේ දැනීම හෝ වරදෙහි නිසොල්මන්වීම නොමැතිව බවට අධිකරණය සෑහීමට පත්වන ආකාරයට ඒ නැවේ, මෝටර් වාහනයේ හෝ ප්‍රවාහන මාධ්‍යයේ හෝ දේපළේ අයිතිකරු විසින් හෝ එහි සන්තකයට නීත්‍යානුකූලව හිමිකම් ඇති තැනැත්තා විසින් ඔප්පු කරන්නේ නම් මිස, ඒ වරද කිරීමේ දී හෝ ඒ සම්බන්ධයෙන් හෝ භාවිත කරන ලද යම් නැවක්, මෝටර් වාහනයක් හෝ ප්‍රවාහන මාධ්‍යයක් හෝ දේපළක් රාජ සන්තක කළ යුතු යයි අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් රාජසන්තක කරනු ලැබූ යම් නැවක්, මෝටර් වාහනයක් හෝ ප්‍රවාහන මාධ්‍යයක් හෝ දේපළක් නියත වශයෙන් ම රජය සතු විය යුතු ය.

එම සතුවීම –

(අ) රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව, අවස්ථාවෝචිත පරිදි, අභියාචනාධිකරණය වෙත හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා ඉඩ දී ඇති කාලය තුළ දී අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක දී, අභියාචනාධිකරණය හෝ ශ්‍රේෂ්ඨාධිකරණය හෝ වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි කාල පරිච්ඡේදය ඉකුත්වීමෙන් පසුව ; හෝ

(ආ) රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව, අවස්ථාවෝචිත පරිදි, අභියාචනාධිකරණය හෝ ශ්‍රේෂ්ඨාධිකරණය හෝ වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, රාජසන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින් හෝ පිළිගනිමින් හෝ ඒ අභියාචනය අවසාන වශයෙන් නිශ්චය කරනු ලැබීමේ දී,

බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් යම් නැවක්, මෝටර් වාහනයක් හෝ ප්‍රවාහන මාධ්‍යයක් හෝ දේපළක් රජය සතු කරනු ලැබූ අවස්ථාවක, එම නැව, මෝටර් වාහනය හෝ ගමනාගමන මාධ්‍යය හෝ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සහ විකිණීමෙන් ලත් මුදල් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත බැර කිරීමට අධිකරණය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

## III වන කොටස
## වැරදි විමර්ශනය කිරීම

**12.** (1) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වූ සෑම වරදක්ම, ඒ පනතේ අර්ථානුකූලව සංඥේය වරදක් සහ ඇපදිය නොහැකි වරදක් විය යුතු ය.

*මේ පනත යටතේ වූ වැරදි සංඥේය හා ඇපදිය නොහැකි වැරදි බව.*

(2) මේ පනතේ 3 වන, 4 වන, 5 වන, 6 වන හෝ 7 වන වගන්ති යටතේ වරදක් සිදු කිරීමට සම්බන්ධව ඇතැයි හෝ වරදක් සිදු කර ඇතැයි සැකකරනු ලැබූ හෝ චෝදනා ලැබූ යම් තැනැත්තකු, විශේෂ පරිවේෂණ තිබෙන බව පෙන්වා දීමෙන් පසු මහාධිකරණ විනිශ්චයකාරවරයකු විසින් හැර, ඇප මත මුදාහරිනු නොලැබිය යුතු ය.

**13.** (1) සෑම පොලිස් නිලධරයකු, සන්නද්ධ හමුදාවේ නිලධරයකු, ශ්‍රී ලංකා රේගුවේ නිලධරයකු, හෝ අමාත්‍යවරයා විසින් විශේෂයෙන් ලියවිල්ලකින් නම් කරන ලද විශේෂ දැනීමක් ඇති ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිලධරයකු මේ පනතේ කාර්ය සඳහා බලයලත් නිලධරයකු විය යුතු ය.

*බලයලත් නිලධරයකු සාම නිලධරයකු වශයෙන් සැලකිය යුතු බව.*

(2) මේ පනතේ කාර්ය සඳහා, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව යම් සාම නිලධරයකු හෝ පරීක්ෂකවරයකු වෙත, සංඥේය වැරදි සම්බන්ධයෙන් පවරා

ඇති හෝ නියම කර ඇති බලතල හා කාර්ය කිසිවක් ක්‍රියාත්මක කිරීම සඳහා සෑම බලයලත් නිලධරයකුම ඒ පනතේ අර්ථානුකූලව සාම නිලධරයකු හා පරීක්ෂකවරයකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

අපරාධ නඩු විධාන සංග්‍රහය අදාළ විය යුතු බව.

**14.** මේ පනත මගින් අන්‍යාකාර විධිවිධාන සලස්වා ඇති පරිදි, හැර, මේ පනත යටතේ වූ සියලු වැරදි සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට අනුකූලව විමර්ශනය කිරීම, විභාග කිරීම හෝ අන්‍යාකාරයකින් කටයුතු කිරීම කරනු ලැබිය යුතු ය.

බලයලත් නිලධරයකුගේ බලතල.

**15.** (1) මුහුදු කොල්ලකෑමේ වරද සිදු කොට ඇති බවට, හෝ සිදු කර ගෙන යනු ලබන බවට හෝ සිදු කරනු ලැබිය හැකි බවට සැක කිරීමට තරම් යුක්ති සහගත හේතු බලයලත් නිලධරයකු සතුව පවත්නා අවස්ථාවක, ඒ වරද සිදු කිරීම සඳහා, අවස්ථාවෝචිත පරිදි, භාවිත කරන ලදැයි නැතහොත් ඒ වරදට සම්බන්ධ වී තිබුනේ යයි හෝ ඒ වරද සිදු කිරීම සඳහා භාවිත කරනු ලැබේ යයි හෝ සම්බන්ධ වේ යයි හෝ යුක්ති සහගත ලෙස ඒ බලයලත් නිලධරයා සැක කරන –

(අ) යම් නැවක්, මෝටර් වාහනයක්, හෝ වෙනත් ප්‍රවාහන මාධ්‍යයක් නතර කොට ඊට ගොඩවීම ;

(ආ) යම් පරිශ්‍රයකට ඇතුළුවීම ;

(ඇ) එවැනි යම් නැවක, මෝටර් වාහනයක, ප්‍රවාහන මාධ්‍යයක හෝ පරිශ්‍රයක සිටින යම් තැනැත්තකු හෝ එහි තිබෙන යම් දේපළක් හෝ පරීක්ෂා කිරීම ;

(ඈ) යම් නැවක්, මෝටර් වාහනයක්, ප්‍රවාහන මාධ්‍යයක් හෝ පරිශ්‍රයක් තහනමට ගැනීම,

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ වෙළෙඳ නැව් අධ්‍යක්ෂවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග වලින් නියම කරන ලද කාර්ය පටිපාටි තරයේ අනුගමනය කරමින් ඒ නිලධරයා විසින් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, බලයලත් නිලධරයකු විසින් මේ පනත යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, මුහුද කොල්ලකෑමේ ක්‍රියාවකින් බලපෑමක් ඇති වූ හෝ බලපෑමකට අවකාශ ඇත්තා වූ යම් නැවකට ගොඩවීම ඒ නැවේ නෞකාධිපතිවරයා හෝ ඒ නැව භාර වෙනත් යම් නිලධරයකුගේ අවසරය නොමැතිව, කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය මගින් තමා වෙත පැවරුණු බලතල ක්‍රියාත්මක කිරීමේ දී, යම් නැවක්, මෝටර් වාහනයක්, ප්‍රවාහන මාධ්‍යයක් හෝ දේපළක් තහනමට ගැනීම බලාත්මක කිරීමේ දී යම් බලයලත් නිලධරයකු විසින් යුක්ති සහගත ලෙස අවශ්‍ය යයි සලකන යම් බලයක් යොදවනු ලැබිය හැකි ය.

(3) (අ) (1) වන උපවගන්තිය මගින් තමා වෙත පැවරුණු බලතල ක්‍රියාත්මක කිරීමේ දී යම් බලයලත් නිලධරයකු විසින් යම් නැවක්, මෝටර් වාහනයක්, ප්‍රවාහන මාධ්‍යයක් හෝ දේපළක් තහනමට ගනු ලැබූ අවස්ථාවක, ඒ බලයලත් නිලධරයා විසින් ප්‍රායෝගික වශයෙන් කළ හැකි තාක් ඉක්මණින් ඒ නැව, මෝටර් වාහනය, ප්‍රවාහන මාධ්‍යය හෝ දේපළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් බස්නාහිර පළාත සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ විනිශ්චයකාරවරයා වෙත ඉදිරිපත් කිරීම හෝ ඔහු විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා ලබා දීම හෝ කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ යම් නැවක්, මෝටර් වාහනයක්, ප්‍රවාහන මාධ්‍යයක් හෝ දේපළක් ඉදිරිපත් කරන ලද්දේ යම් විනිශ්චයකාරවරයකු ඉදිරියේ ද, ඒ විනිශ්චයකාරවරයා විසින් අවශ්‍ය යයි තමා සලකන යම් පරීක්ෂණයක් කිරීමෙන් පසුව ඒ නැව, මෝටර් වාහනය, ප්‍රවාහන මාධ්‍යය හෝ දේපළ, මේ පනතේ 3 වන හෝ 4 වන, වගන්තිය යටතේ වරදක් කිරීමේ දී හෝ කිරීම සම්බන්ධයෙන් භාවිත කරනු ලැබ ඇති බවට සෑහීමට පත් වූ අවස්ථාවක, ඒ නැව, මෝටර් වාහනය, ප්‍රවාහන මාධ්‍යය හෝ දේපළ රාජසන්තක කළ යුතු යයි ඔහු විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

(ඇ) 11 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ රාජසන්තක කිරීමේ ආඥාවට අදාළ විය යුතු ය.

## IV වන කොටස
## වැරදි පිළිබඳ නඩු විභාගය

මේ පනත යටතේ වැරදි විභාග කිරීම සඳහා මහාධිකරණය සතු අධිකරණ බලය.

**16.** වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ 3 වන, 4 වන, 5 වන, 6 වන හෝ 7 වන වගන්ති යටතේ වූ යම් වරදක්, ශ්‍රී ලංකා දේශීය ජල තීරය ඇතුළත දී සිදුකර ඇති අවස්ථාවක දී, හෝ ශ්‍රී ලංකා දේශීය ජල තීරයෙන් පිටත දී ශ්‍රී ලාංකිකයකු විසින් සිදුකර ඇති අවස්ථාවක දී, හෝ ශ්‍රී ලංකා දේශීය ජල තීරයෙන් පිටත දී ශ්‍රී ලංකාවෙහි ලියාපදිංචි කර ඇති නැවක් සම්බන්ධයෙන් සිදුකර ඇති අවස්ථාවක දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ බස්නාහිර පළාත සඳහා පිහිටුවන ලද මහාධිකරණයට ඒ වරද විභාගකර, තීරණය කිරීමේ අධිකරණ බලය ඇත්තේ ය.

අධිචෝදනා කිරීමට නීතිපතිවරයා සතු බලය.

**17.** (1) 1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ 3 වන, 4 වන, 5 වන, 6 වන හෝ 7 වන වගන්තිවල විධිවිධාන කිසිවක් කඩ කිරීම හේතුකොට ගෙන මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින්, ඒ පනතේ XV වන පරිච්ඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි, මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් පවත්වනු ලබන මූලික පරීක්ෂණයක් නොමැතිව, අදාළ මහාධිකරණය ඉදිරියේ යම් තැනැත්තකුට විරුද්ධව අධිචෝදනා කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නීතිපතිවරයා විසින් යම් තැනැත්තකුට මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා කරනු ලබන යම් අවස්ථාවක දී, පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය :-

(අ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 162 වන වගන්තිය මගින් නියමිත යම් ආකාරයකට පිළියෙල කරන ලද අධිචෝදනාවක් නීතිපතිවරයා විසින් මහාධිකරණය වෙත යවනු ලැබිය යුතු ය. අධිචෝදනාව මත නඩු විභාගයට ලක් කෙරෙන චූදිත තැනැත්තා හෝ එක් එක් චූදිත තැනැත්තා වෙත භාරදීම සඳහා අධිචෝදනාවේ පිටපතක් හෝ පිටපත් නඩු විභාගය පැවැත්වෙන අධිකරණයේ පිස්කල් වෙත නීතිපතිවරයා විසින් ඒ අවස්ථාවේ දී ම යවනු ලැබිය යුතු ය. නීතිපතිවරයාගෙන් තමා වෙත ලැබුණු අධිචෝදනාවේ පිටපත හෝ පිටපතක් චූදිත තැනැත්තා වෙත හෝ එක් එක් චූදිත තැනැත්තා වෙත වහාම සහ නඩු විභාගයට නිශ්චිත දිනට යටත් පිරිසෙයින් දින දාහතරකට පෙර, පිස්කල් විසින් භාර දිය යුතු ය ;

නැතහොත්, භාරදීමට සැලැස්විය යුතු ය. තව ද, එම භාරදීම පිළිබඳව මහාධිකරණය වෙත සහ නීතිපතිවරයා වෙත හෝ නීතිපතිවරයා නියෝජනය කිරීම සඳහා ඔහු විසින් පත් කරන ලද යම් නිලධරයකු වෙත දැනුම් දිය යුතු ය.

(ආ) අධිචෝදනාව ලැබුණු වහාම, චූදිත තැනැත්තාගේ නඩු විභාගය නියමිත දින නිශ්චිතව සඳහන් කෙරෙන දැන්වීමක් වහාම චූදිත තැනැත්තා වෙත භාරදීමට මහාධිකරණය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(ඇ) (i) මේ ඡේදයේ (ii) වන අනුඡේදයේ විධිවිධානවලට යටත්ව, යම් අධිචෝදනාවක් හෝ නඩු විභාගය පිළිබඳ දැන්වීමක් චූදිත තැනැත්තකු වෙත භාරදීම, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 45 වන සහ 46 වන වගන්තිවල සිතාසි භාරදීම සම්බන්ධයෙන් නියම කරනු ලැබ ඇති ආකාරයට බලාත්මක කරනු ලැබිය යුතු අතර, ඒ භාරදීම ඔප්පු කිරීමේ කාර්යය සඳහා, ඒ පනතේ 49 වන වගන්තියේ විධිවිධාන එපරිද්දෙන් අදාළ විය යුතු ය.

(ii) මේ ඡේදයේ (i) වන අනුඡේදයේ නිශ්චිතව සඳහන් ආකාරයට නිසි උද්යෝගය ක්‍රියාත්මක කිරීමෙන් භාරදීම කළ නොහැකි නම්, චූදිත තැනැත්තා සාමාන්‍යයෙන් වාසය කරන නිවසේ කිසියම් ප්‍රකට ස්ථානයක අධිචෝදනාව හෝ දැන්වීම ඇලවිය යුතු අතර, එබඳු අවස්ථාවක දී, අධිචෝදනාව හෝ දැන්වීම යථා පරිදි භාරදුන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඈ) නීතිපතිවරයා විසින් නඩු විභාග දිනට පෙර, චූදිත තැනැත්තා වෙත –

(i) චෝදනාවේ විස්තර පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක්, සාක්ෂි දීමට කැඳවනු ලැබිය හැකි සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක් සහ චෝදක විසින් භාවිත කරනු ලැබිය හැකි ලේඛන පිළිබඳ ලැයිස්තුවක් ; සහ

(ii) චෝදක විසින් විශ්වාසය තැබීමට යෝජිත යම්තාක් වූ කරුණු පිළිබඳ සාරාංශයක්,

සපයා දීමට සලස්වනු ලැබිය යුතු ය.

(ඉ) මහාධිකරණය හෝ චෝදක විසින් ඒ තැනැත්තා පිළිබඳ නඩු විභාගයේ දී වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අධිචෝදනාවේ නිශ්චිතව සඳහන් කර නොමැති යම් සාක්ෂිකරුවකු කැඳවීම හෝ යම් ලේඛනයක් භාවිත කිරීම හෝ ඉදිරිපත් කිරීම, කරනු ලැබිය හැකි ය.

සාක්ෂි.

**18.** (1) සාක්ෂි ආඥාපනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ 3 වන, 4 වන, 5 වන, 6 වන හෝ 7 වන වගන්ති යටතේ වැරදි සඳහා වූ නීතිකෘත්‍ය සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) යම් නැවක යම් නිලධරයකු, සේවානියුක්තයකු හෝ මගියකු විසින් කරන ලද සහ මේ පනත යටතේ විමර්ශනයක දී හෝ පරීක්ෂණයක දී සටහන් කරනු ලැබ ඇත්තා වූ ද, මේ පනතේ 3 වන, 4 වන, 5 වන, 6 වන හෝ 7 වන වගන්ති යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන යම් විවාදයට භාජන වූ කරුණකට හෝ අදාළ කාරණයකට සම්බන්ධ වූ ද, පාපොච්චාරණයක් නොවන යම් ප්‍රකාශයක්, එකී නීති කෘත්‍යයේ දී සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ 3 වන හෝ 4 වන හෝ 5වන හෝ 6 වන හෝ 7 වන වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන නීති කෘත්‍යයක විවාදයට භාජනය වූ කරුණකට හෝ අදාළ කාරණයකට සම්බන්ධව යම් තැනැත්තකු විසින් ලේඛනයක හෝ වෙනත් වාර්තාවක කර ඇති යම් ප්‍රකාශයක් –

(අ) විවාදයට භාජනය වූ ඒ කරුණ හෝ අදාළ කාරණය පිළිබඳව ඒ තැනැත්තා විසින් දෙනු ලබන සෘජු වාචික සාක්ෂිය ඒ නීති කෘත්‍යයේ දී ආවේශ්‍ය කළ හැකි වේ නම් ; සහ

(ආ) ප්‍රකාශය කරන ලද තැනැත්තා මියගොස් ඇත්නම් හෝ ඔහුගේ ශාරීරික හෝ මානසික තත්ත්වය හේතුකොටගෙන සාක්ෂිකරුවකු වශයෙන් පෙනී සිටීමට නුසුදුසු වේ නම් ; හෝ

(ඇ) ප්‍රකාශය කරන ලද තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර වී ඇත්නම් හෝ ඒ තැනැත්තා සොයා ගැනීමට සාධාරණ පියවර ගැනීමෙන් පසු සොයාගත නොහැකි නම් හෝ ප්‍රකාශය කරන ලද තැනැත්තා ඒ නීති කෘත්‍යයේ දී සාක්ෂි දීමෙන් වළක්වාලන බව විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම් ; සහ

(ඈ) ප්‍රකාශය, නීති කෘත්‍යය අදාළ වන වරද සම්බන්ධයෙන් චෝදනා ලැබූ තැනැත්තකු විසින් කරන ලද පාපොච්චාරණයක් නොවන්නේ නම්,

ඒ නීති කෘත්‍යයේ දී ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය.

(4) යම් ව්‍යාපාරයක දී, කර්මාන්තයක දී, වෘත්තියක දී හෝ නිරන්තරයෙන් පවත්වා ගෙන යනු ලබන වෙනත් කටයුත්තක දී සකස් කරන ලද්දා වූ, පිළියෙල කරන ලද්දා වූ, ලැබුණා වූ හෝ ලබා ගත්තා වූ සහ මේ පනතේ 3 වන, 4 වන, 6 වන හෝ 7 වන වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන යම් නීති කෘත්‍යයක විවාදයට භාජන වූ කරුණට හෝ ඊට අදාළ කාරණයට සම්බන්ධතාවක් ඇත්තා වූ ලේඛනයක හෝ වෙනත් වාර්තාවක ඇතුළත් යම් ප්‍රකාශයක්, –

(අ) විවාදයට භාජන වූ කරුණ හෝ ඊට අදාළ යම් කාරණය හෝ පිළිබඳ ඍජු වාචික සාක්ෂි ඒ නීති කෘත්‍යයේ දී ආවේශ්‍ය වේ නම් ;

(ආ) ඒ ප්‍රකාශය, නීති කෘත්‍ය අදාළ වන වරදට චෝදනා ලැබූ තැනැත්තකු විසින් කරන ලද පාපොච්චාරණයක් නොවන්නේ නම්,

ඒ නීති කෘත්‍යය පිළිබඳ සාක්ෂියේ දී ඒ ප්‍රකාශය ආවේශ්‍ය කරනු ලැබිය හැකි ය.

පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ ලේඛනයේ හෝ වෙනත් සටහනේ ඇතුළත් ප්‍රකාශය සත්‍ය බවට අධිකරණය විසින් පූර්ව නිගමනය කරනු ලැබිය යුතු අතර, යම් තැනැත්තකු

විසින් සකස් කරන ලද්දා වූ, ගොනු කරන ලද්දා වූ, ලැබුණා වූ හෝ ලබා ගත්තා වූ හෝ ලේඛනයක් හෝ සටහනක් සම්බන්ධයෙන් වන විට, ඒ ලේඛනය හෝ සටහන, එය සකස් කරන ලදැයි, ගොනු කරන ලදැයි, ලැබුනේ යයි හෝ ලබාගත්තේ යයි කියනු ලබන තැනැත්තා විසින් සකස් කරන ලද, ගොනු කරන ලද, ලැබුණා වූ හෝ ලබාගන්නා ලද ලේඛනයක් හෝ සටහනක් බවට පූර්ව නිගමනය කළ යුතු ය.

(5) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවලට යටත්ව, මේ පනතේ 3 වන හෝ 4 වන හෝ 5 වන හෝ 6 වන හෝ 7 වන වගන්තිය යටතේ වරදක් කරන ලදැයි සැක කරන යම් තැනැත්තකු විසින් කරන ලද පාපොච්චාරණයක් බවට පත් වන යම් ප්‍රකාශයක්, එම ප්‍රකාශය පොලිස් නිලධරයකුට කර නොමැත්තේ නම් සහ සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තිය යටතේ අදාළ නොවන්නේ නොවේ නම්, මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් වූ යම් නීති කෘත්‍යයක දී ඔහුට එරෙහිව ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය.

## V වන කොටස
## සාමාන්‍ය විධිවිධාන

බලයලත් නිලධරයන්ට අවහිර කිරීම, යනාදිය.

**19.** (1) මේ පනතින් යම් බලයලත් නිලධරයකු වෙත පැවරුණු යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ දී ඔහුට ප්‍රතිරෝධය පාන හෝ බාධා කරන නැතහොත්, යම් බලයලත් නිලධරයකු විසින් දෙන ලද යම් නීත්‍යානුකූල නියමයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින හෝ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු තුනක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් කඩකරන සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

බලයලත් නිලධරයන් ආරක්ෂා කිරීම.

**20.** යම් බලයලත් නිලධරයකු විසින් සද්භාවයෙන් කරන ලද්දා වූ හෝ නොකර හැරියා වූ යම් දෙයක් සම්බන්ධයෙන් කවර වූ හෝ සිවිල් හෝ අපරාධ නඩුවකට හෝ නඩු පැවරීමකට ඔහු යටත් නොවිය යුතු ය.

**21.** (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධිවිධාන එලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තිය මගින් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඒ අතුරෙන් යම් කාරණයක් හෝ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :–

(අ) මේ පනත යටතේ වූ වැරදි වැළැක්වීමේ, සොයා දැන ගැනීමේ සහ විමර්ශනය කිරීමේ කාර්යය සඳහා ගතයුතු පියවර ;

(ආ) (i) යම් නැව් පන්තියක් සම්බන්ධයෙන් සීමා කළ හෝ තහනම් කලාප වශයෙන් කලාප කිසිවක් නිශ්චය කිරීම, සහ

(ii) එසේ නිශ්චය කරනු ලැබූ සීමා කළ කලාප කිසිවකට ඇතුල්වීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම ;

(ඇ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සම්බන්ධීකරණ සහ සමීක්ෂණ කර්තව්‍ය ;

(ඈ) මේ පනත යටතේ වැරදි සොයා දැනගැනීමට තුඩු දෙන තොරතුරු සපයන තැනැත්තන්ට සහ මුහුදු කොල්ලකෑම මැඩ පැවැත්වීමේ පියවර ක්‍රියාත්මක කරන තැනැත්තන්ට ත්‍යාග ප්‍රදානය කිරීම පිණිස ත්‍යාග දීමනා ක්‍රමයක් ඇති කිරීම ;

(ඉ) බලයලත් නිලධරයකු විසින් 15 වන වගන්තිය යටතේ බලතල ක්‍රියාත්මක කරනු ලැබීම සඳහා කාර්ය පරිපාටි සකස් කිරීම.

(3) නාවුක කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සහ සමුද්‍ර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් හා ක්‍රියාත්මක කළ හැකිතාක් දුරට අනුකූලව හැර, (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග කිසිවක් සාදනු නොලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ පළ කිරීමේ දින හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු, හැකි පහසු ඉක්මණින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකළ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට, එහෙත්, ඒ යටතේ කලින් සාදන ලද යම් දෙයකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(6) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**22.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**23.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි –

"පාපොච්චාරණය" සහ "විවාදයට භාජනය වූ කරුණු" යන්නට, සාක්ෂි ආඥාපනත මගින් ඒවාට දී ඇති ඒ ඒ අර්ථය ම ඇත්තේ ය ;

"මාරක ආයුධය", "වංක ලෙස", "බලාත්කාරය", "සොරකම", "ස්වේච්ඡාවෙන්ම තුවාල සිදු කිරීම" යන යෙදුම්වලට දණ්ඩනීති සංග්‍රහයෙහි ඒවාට දී ඇති අර්ථයන් ම ඇත්තේ ය ;

"මෝටර් වාහනය" යන්නට, මෝටර් වාහන පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"නැව" යන්නෙන්, සෑම විස්තරයකම නැවක් හෝ යාත්‍රාවක් හෝ බෝට්ටුවක්, නැතහොත්, යාත්‍රාකිරීමෙහි දී යොදාගනු ලබන වෙනත් යම් විස්තරයක යාත්‍රාවක් අදහස් වන අතර, යාත්‍රාකිරීම සහ නැවේ කටයුතු පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු උපකරණ, ඇහලුම් සහ වෙනත් අදාළ දේ (යැපීම සඳහා වූ සැපයීම් බැහැරකොට) ඊට ඇතුළත් වේ ;

"ශ්‍රී ලංකා වරාය අධිකාරිය" යන්නෙන්, 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.